දිනමිණ
2024 නොවැම්බර් 13 බදාදා

" අපි වේලාසනින්
අවදි වුණෙමු.
එහෙත් අප වේලාසනින්
අවදි වූ පමණින්
වේලාසනින් හිරු පායන්නේ නැත.
නමුත් කවදා හෝ දිනක
හිරු පායද්දී
වේලාසනින් අවදි වී සිටීම
අපට ප්‍රයෝජනවත්ව
තිබෙනු ඇත... "



පිටුව 6

හෙට බැහැර යෑමට සිටි **ගමනායක අද මරා දැමූ හැටි**

පිටුව 4-5



**මේ සමාජය** වෙනසක් කළ හැක්කේ අපටමයි

වියත් සංවාදයකට පෙරවදනක්

# මනුෂ්‍යත්වය **සොයාගිය මිනිසා**



ප්‍රවේශ
වියත් සංවාදයට පෙරවදනක්

වේලාසනින් අවදි වූ ඔවුහු ජීවිතයෙන්ද වේලාසන සමුගෙන ගියෝය. නව ලිබරල්වාදී ප්‍රවාහය ඉදිරියේ ජනතාවාදය වෙනුවෙන් උඩුගං බලා පිහිනීමේ වරදට ඔවුහු එසේ වන්දි ගෙවූ කළ, මර්දනයේ හස්තය සිතට ගත්තේ යළි එහි නැගිටීමක් නැති බවය. වේලාසනින් අවදිවී සිටීම කවරදා හෝ පල දරනා බවක් පමණක් විජේවීරයන් ප්‍රකාශ කරන ලද්දේ මේ මර්දනය මත්තේ ඉදිවෙන ලෝකය නොවැලක්විය හැකි බවට පෙර ඉගියක් ලෙසිනි. ඒ කියමන දෑස මානයේ සැබෑවී ඉල්මහ විරු අභිප්‍රාය පල දරා ඇති මේ මොහොතේ 'ප්‍රවේශ' සිය පළමු වෑයම එළිදක්වන්නේ ඉල්මහ විරු මතකාවර්ජනයක් ලෙස පමණක් නොවේ. එය හැදෑරීම සඳහා වන අවකාශයක් ද අත්‍යාවශ්‍ය බැවිනි


# රෝහණ සහෝදරයා ප්‍රාර්ථනා කළ ලෝකය

## අපට ගොඩනඟන්න පුළුවන් වුණා

**ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක සාමාජිකාවක ලෙසින් ද රෝහණ විජේවීර සහෝදරයාත් සමඟ එකට දේශපාලනය කර අදත් පක්ෂය සමගත් තරුණ පෙළ සමගත් කරට කර සිට දේශපාලනය කරන යූ. ඒ. නන්දසීලි සහෝදරිය සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවකින් සැකසූ ලිපියකි මේ.**

වල්පොළගම හරහා නුවර බලා රේල්ලුව ගමන් කරන්නට පටන් ගෙන අවුරුදු එකසිය පනහද ඉක්මවා ගොස් තිබේ. ඒ කාලය තුළ වල්පොළ මෙන්ම රටත් ලෝකයත් ලොකු වෙනසකට භාජනය වී තිබේ. බොහෝ දේ වෙනස් වී තිබේ. හැත්තෑව දශකයේ තිබූ බොහෝ දේද අදවන විට වෙනස්ව තිබේ. ඒ සියලු වෙනස්කම් අතර නොවෙනස්ව පවතින දේද තිබේ. එසේ නොවෙනස්ව පැවැතීම යනු අමුතු දෙයකි. ඒ අතර මනුෂ්‍යකු එකම මතයක එකම අදහසක අවුරුදු හැටකට වඩා වැඩි කාලයක් සිටීම යනු තවත් සුවිශේෂ දෙයකි. ඒ නොවෙනස් වීම දේශපාලනය තුළ තවත් විශේෂ තත්ත්වයකි. අත්තෙන් අත්තට වාසිය සොයා යන මිනිසුන් අතර එකම දේශපාලන අදහසක නොවෙනස්ව සිටීමද කිසිදු වාසියක් වරප්‍රසාදයක් නොතකා මරණය පවා අපේක්ෂා කරමින් අනතුරු දායක දේශපාලනයක නිරත වීම තවත් අමුතු කතාවකි.

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය සමඟ එක් වෙමින් කටයුතු කිරීම වරප්‍රසාද වෙනුවෙන් සිදු කරනු ලබන දේශපාලනයක් නොව සැබෑ සමාජවාදී අරමුණු වෙනුවෙන් ඉටු කරනු ලබන දේශපාලනයකි. සැබැවින්ම



එදා විජේවීර පවුල

සුකුමල විශ්වවිද්‍යාල සිසුවියක මේ දුෂ්කර මාර්ගය තෝරා ගැනීම යනු පුදුමයට කරුණකි. එසේ නොවෙනස්ව එක්ව අරමුණක තරුණියක ලෙසත් ගැහැණියක ලෙසත්,



යූ. ඒ. නන්දසීලි

මිත්තණියක ලෙසත් කටයුතු කිරීම වෙනස්ම දෙයකි. රෝහණ විජේවීර සහෝදරයාත් සමඟ එකට දේශපාලනය කර අදත් පක්ෂය සමඟ තරුණ පෙළ සමඟ කරට කර සිට දේශපාලනය කරන ඇය යූ. ඒ නන්දසීලි සහෝදරියයි. අද ඇය වියපත්ව සිටියද අදත් දේශපාලනයේ සිටින ප්‍රමුඛ සහෝදරියකි, ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක සාමාජිකාවකි. ඇය රෝහණ විජේවීර සහෝදරයා සමඟ ප්‍රසිද්ධ දේශපාලනය කළ කාන්තා සහෝදරියන් අතර අදත් පක්ෂය සමඟ සිටින, නායිකාවකි. රෝහණ විජේවීර සහෝදරයා සමඟ සමීප දේශපාලන සබඳතා ගොඩනඟා ගත් නන්දසීලි සහෝදරිය ජනතා විමුක්ති පෙරමුණ සමඟ එක්වන්නේ 1970 වර්ෂයේදීය. ඇය ඒ වන විට විසිහැවිරිදි සරසවි ශිෂ්‍යාවකි. ඇය ඉගෙනුම ලබමින් සිටියේ කොළඹ විශ්වවිද්‍යාලයේය.

1970 දී පක්ෂය සමඟ සබඳතා ඇති කර ගත් ඇය, 1071 අරගලයට එක්වීම නිසා සරසවියෙන් යාමට සිදුවන්නේ සිරගෙදරටය. ජවිපෙ සිටි ළාබාලම වියේ සිටි තරුණියක වන්නේ ඇයයි.

"මම අත්අඩංගුවට පත්වන්නේ 1971 අවුරුද්දේ මැයි 26 වනදායි එදින අත්අඩංගුවට පත් ඇය නැවතත් නිදහස් ජීවිතයට එළඹෙන්නේ 1975 වර්ෂයේදී අත්හිටවූ සිර දඬුවමක් පනවා නිදහස් ලෝකයට පිවිසුණ ද ඇය තම දේශපාලන මතය බිඳකුදු අත්හැරියේ නැත.

"මම වෙනස් වුණේ නැහැ, ඒත් අපිත් එකක් හිටපු ගොඩක් අය වැරැදි පිළිඅරන් නිදහස් වුණා, නැතිනම් රජයේ සාක්ෂිකාරයකු බවට පත් වුණා. ඒත් මම සහ කීපදෙනෙකු පමණක් එක දිගටම එකම අදහසේ සිටියා.

මම රෝහණ සහෝදරයාව දැක්කේ මුලින්ම බන්ධනාගාරය තුළදී, මම වෙනත් රැඳවියකු බලන්න යන කෙනෙකු විදිහට ඇතුළට ගියා. එතැනට ගියේ විජේවීර සහෝදරයා හමුවන්න. එහිදී විජේවීර සහෝදරයා අපට අත වැනුවා, එදා ඒ විදිහට සහෝදරයා සමඟ සම්බන්ධතාවය ආරම්භ වුණා.

1977 ආණ්ඩු පෙරළිය සමඟ අලුත් දේශපාලන තත්ත්වයක් ඇති වුණා. ඒ කාලයේදී රෝහණ විජේවීර සහෝදරයා නිදහස්ව ආවා, ඒ සමඟ ඔහුට දේශපාලනය තුළ අලුත් යුගයක් අලුත් ක්‍රමයක් සඳහා මාර්ගය විවෘත වුණා.

**එතකොට විජේවීර සහෝදරයා පුද්ගලයකු විදිහට මොන වගේ චරිතයක්ද?**

"විජේවීර සහෝදරයා පිළිබඳව එළියේ සමාජය හිතනවාට වඩා ගොඩක් සරල මිත්‍රශීලී පුද්ගලයෙක්, ඇත්තෙන්ම ඔහුට සහෝදරයා කියලා ඇමතීමේ වරදක් නැහැ. අසූව දශකයේ මුල් කාලයේ මගෙ දුව ලැබුණාම තෑගි බෝග අරන් අපේ ගෙදර ආවා. රෑ වෙද්දි අපට ගේ අවටින් සද්දයක් ඇහුණා මිනිස්සු කතා කරනවා වගේ. අපි හිතුවා පොලිසියෙන්වත් ඇවිද්ද කියලා. ඒත් පස්සේ තේරුණා ගමේ අය පිරිසක් කියලා. විජේවීර සහෝදරයා කීවා එයාලට එන්න කියන්න කියලා. ඊට පස්සේ ගමේ අයත් එක්ක සහෝදරයා ඉතාමත් සුහඳව කතා කළා. ගමම පුදුම වුණා රටම දන්න විප්ලවවාදියා මෙතරම් නිහතමානී සරල කෙනෙක්ද කියලා.

අපේ ගෙදර ඇවිත් පහුවෙනිදා කොළඹදී විජේවීර සහෝදරයා කාන්තා සහෝදරියක විදිහටත් මමත් එක්ව ප්‍රවෘත්ති සාකච්ඡාවක් තිබ්බා. ඒ වෙද්දි පක්ෂයේ ප්‍රසිද්ධ තලයේ දේශපාලනය කරන කාන්තා නායිකාවක් විදිහටයි මම සිටියේ. ඒ වගේම රට වටාම ජවිපෙ රැස්වීම් වටයක් කළා. ඒ හැම රැස්වීමකටම විජේවීර සහෝදරයා සමඟ මමත් ජනතාව ආමන්ත්‍රණය කරන්න ගියා. හම්බන්තොට දිස්ත්‍රික්කයේදී 71 දී මරා දමන ලද ප්‍රේමවතී මනම්පේරි සහෝදරියගේ විශාල සැමරුමක් පැවැත්වූවා.

**රෝහණ සහෝදරයා අන්තිමට හම්බ වුණේ කවද්ද ?**

මම 1987 වගේ තමයි රෝහණ සහෝදරයාව හමු වුණේ. ඉන්පසු අප කවදාවත් හමුවුණේ නැහැ. මටත් මගේ පවුලටත් එදා පැවැති පාලනයෙන් මරණ තර්ජන ආවා; අත්අඩංගුවට ගත්තේ පුරුද්දට වගේ. මගේ මහත්තයත් පක්ෂයේ පූර්ණකාලීන ක්‍රියාකාරිකයෙක්, අන්තිමට මම 1987 දී රට රැකියාවකට ගියා. ආයේ ලංකාවට ආවේ 1997 දී ඒ වෙද්දි රට ගොඩක් වෙනස් වෙලා. පක්ෂය නැවත මැතිවරණ දේශපාලනය තුළ ඉහළට එමින් තිබුණා. මමත් මැතිවරණ දේශපාලනය තුළට පැමිණියා. මම තමයි ජාඇළ ප්‍රාදේශීය සභාවේ පළමු කාන්තා නියෝජිතවරිය. ඉන්පසු මම බස්නාහිර පළාත් සභාවටත් තේරී පත්වුණා.

ඇත්තෙන්ම රෝහණ සහෝදරයා ප්‍රාර්ථනා කළ ලෝකය අපට එක කණ්ඩායමක් විදිහට ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණා.

**උදිත ගුණවර්ධන**

**ඡායාරූපය - සුදත් මලවීර**

# දැන් අපි ආරම්භ කර තිබෙන්නේ පක්ෂය නඟාසිටවූ ආකාරයටම රට ද නඟාසිටුවන සටනයි

**එක්දහස් නවසිය අසූ නවය ඉල්මහේදී අළු දූවිලි බවට පත් කළ ජනතා විමුක්ති පෙරමුණ අවුරුදු තිස්පහක් ගතවන තැන මෙරට රාජ්‍ය බලය අත්පත් කරගත් ප්‍රධාන දේශපාලන පක්ෂය බවට පත්ව තිබේ. ඒ ගමන විස්මයජනකය, එහෙත් ඔවුන් ඒ සියලු අභියෝග ජයගෙන තිබේ. ඔවුනට එල්ල වූ අභූත චෝදනා, මඩ අවලාද පරාජය කර තිබෙන්නේ මහජන බලයෙනි. මේ ඒ පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතා සමඟ කළ සාකච්ඡාවක් ඇසුරින් සැකසුණු ලිපියකි.**

ජනතා විමුක්ති පෙරමුණ යකඩින් මර්දනය කළ පක්ෂයකි. පොදු අරමුණක් වෙනුවෙන් ජීවිතවලින් වන්දි ගෙවූ අතර 1989 ඉල්මහේදී සිය දිවිය දේශය වෙනුවෙන් පූජා කළේ අප පක්ෂ නායක රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු අප පක්ෂයේ සහෝදරවරුන්ය. එදා පැවති රාජ්‍ය මර්දනය සඳහන් කළේ ජනතා විමුක්ති පෙරමුණ සම්පූර්ණයෙන්ම අවසාන කළ බවය. එහෙත් ඒ මහා සංහාරයෙන් අවුරුදු තිස්පහකට පසු අළු මතින් නැඟී සිටි ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ දේශපාලන බලවේගය මෙරට රාජ්‍ය බලය අත්පත් කරගෙන සිටින්නේ සැප්තැම්බර් 21වන දින සිදු කළ නිහඬ මහජන විප්ලවයකිනි. ප්‍රජාතන්ත්‍රවාදීව මෙරට බහුතර ඡන්ද දායක පිරිසක් ජනතා විමුක්ති පෙරමුණ මුල් කර ගත් ජාතික ජන බලවේගය වෙත සහාය පළ කළ අතර අනුර කුමාර දිසානායක සහෝදරයා මෙරට විධායක ජනාධිපතිවරයා බවට පත්ව සිටී. මේ සඳහා ගමන අතිශය දුෂ්කර සහ කැප කිරීම් රැසක් මැදින් පැමිණි ගමනකි. අප දේශපාලන කැප කිරීම් රැසක් මැද පැමිණි මෙම ගමන විස්මය ජනක බව සමහරු කියති. තවත් අය කියන්නේ දේශපාලන මැජික් එකක් බවය. එහෙත් අපට දහසක් බාධා මැද මෙම ජයග්‍රාහී කඩඉම වෙත පැමිණීමට හැකියාව ලැබී තිබේ.

විජේවීර සහෝදරයා ඇතුළු අපගේ නායක සහෝදරවරු ඝාතනය කිරීමෙන් පසු අප මර්දනය කළ අයගේ සිතුවිලි වැරැදි බවත්, අපට නැවත නැඟී සිටීමට ඇති හැකියාවත් මුලින්ම සමාජය ඉදිරියේ පෙන්වා දුන්නේ 1994 දීය. නැත්තටම නැති කළ බව කියූ ජනතා විමුක්ති පෙරමුණ නැවත ප්‍රජාන්ත්‍රවාදී දේශපාලනය තුළ ස්ථාපිත වූයේ වඩාත් නවීන දේශපාලන පක්ෂයක් ලෙසය. අප පළමු ජයග්‍රහණය ලබා ගත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙනි. හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස පත් වූයේ නිහාල් ගලප්පත්ති සහෝදරයාය. ඉන්පසු අපට දිගින් දිගටම ජයග්‍රහණ රැසක් අත්පත් කර ගැනීමට හැකියාව ලැබිණි. 1994 වර්ෂයේදී තනි මන්ත්‍රී අසුනකින් ආරම්භ කළ ජනතා විමුක්ති පෙරමුණේ ගමන 1997 වර්ෂයේ පැවැති පළාත් පාලන මැතිවරණයේදී සභික ධුර 101ක් ජයග්‍රහණය කිරීමට හැකියාව ලැබිණි. 1989 දී පොළොවටම සමතලා වූ පක්ෂයක් නැවත ජනතාව අතර මුල් බැස ගැනීමට මෙම ජයග්‍රහණය ඉටු කළ කාර්ය අතිශය වැදගත්ය. ඉන්පසු 1999 දී පළාත් සභා තුළ ආසන විසිපහක් ජයගත් ජවිපෙට 2000 මහමැතිවරණයේදී ආසන දහයක්ද 2001 මහමැතිවරණයේදී ආසන 16 ක් දක්වා වර්ධනය කර ගැනීමට ද හැකියාව ලැබිණි.

අපට එතැන් සිට ජාතික දේශපාලන පක්ෂයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ රට පුරා පැතිර ගිය දේශපාලන පක්ෂයක් බවට පත්වීමට හැකියාව ලැබිණි.

විවිධ බිඳ වැටීම් සිදු වීම තුළ සියයට තුනක් තරම් පහළ අඩියකටද අප දේශපාලන ව්‍යාපාරය ඇද වැටුණ අවස්ථා දෙකක්ද තිබිණි. එහෙත් දේශපාලනයේ රිද්මය, ස්වභාවය තේරුම් ගත් එවැනි දෑ නිසා සසල වූයේ නැත. සජීව දේශපාලන ව්‍යාපාරයක් තුළ ඉහළ පහළ යාම ස්වභාවික දෙයකි. එය වටහාගෙන මනාලෙස සංවිධානය වීම තුළ දේශපාලන ජයග්‍රහණ අත්පත් කර ගැනීමට හැකියාව ලැබේ.



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා

**ජනතා විමුක්ති පෙරමුණ යකඩින් මර්දනය කළ පක්ෂයකි. පොදු අරමුණක් වෙනුවෙන් ජීවිතවලින් වන්දි ගෙවූ අතර 1989 ඉල්මහේදී සිය දිවිය දේශය වෙනුවෙන් පූජා කළේ අප පක්ෂ නායක රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු අප පක්ෂයේ සහෝදරවරුන්ය. එදා පැවති රාජ්‍ය මර්දනය සඳහන් කළේ ජනතා විමුක්ති පෙරමුණ සම්පූර්ණයෙන්ම අවසාන කළ බවය.**

ජනතා විමුක්ති පෙරමුණ යනු සෙසු දේශපාලන පක්ෂවලට වඩා වෙනස් ව්‍යාපාරයකි, අප පක්ෂය විනය පිළිබඳව ඉහළින්ම හිතන විනය කඩ කරන්නන් අනුකම්පා විරහිතව ඉවත් කරනු ලබන පක්ෂයකි. එක් අවස්ථාවක ජනතා විමුක්ති පෙරමුණ තුළ ඉහළම තලයේ සිටි විමල් වීරවංශ මහතා පක්ෂයෙන් ඉවත් කිරීමට තීරණය කළේ පක්ෂයට අනාගතයේ සිදු විය හැකි හානි පාඩු පිළිබඳව පවා නොසිතමිනි. තවත් විටෙක් අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ධුරයෙන් නෙරපනු ලැබුවේ දූෂිත ක්‍රියාවක් ඔප්පු වීම නිසාවෙනි. ලොකු පොඩි කවුරුන් වුවත් ඔවුන් අපේ හිතවතුන් වුවද අහිතවතුන් වුවද පක්ෂයේ නීතිය විනය සැමට සමානය. පක්ෂයේ සාර්ථකත්වයට එම සෘජු නෛතික ක්‍රියා පිළිවෙත මහත් රුකුලක් විය.

ජනතා විමුක්ති පෙරමුණ නිතරම හැකියාවට දක්ෂතාවට මූලිකත්වය දෙන පක්ෂයකි. බිම් මට්ටමේ සිට ඉහළම නායකත්වය දක්වා ගමන් කිරීමට පක්ෂය තුළ ක්‍රමවේදයක් තිබේ. සෙසු දේශපාලන පක්ෂවල නැත්තේද එයයි. එයද 1989 මර්දනයෙන් පසු නැවත නැඟී සිටීමටත් රටේ නායකත්වය දක්වා ගමන් කිරීමට ද හොඳම මාර්ගය බවට පත්විය.

අවශ්‍ය අවස්ථාවේදී පක්ෂයේ මුහුණුවර නවීකරණය වීමද මර්දනයෙන් පසු නැවත නැඟීසිටීමට ප්‍රධාන හේතුවක් බවට එය පත්විය.

ජනතා විමුක්ති පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුළ ස්ථාපිතව තිබුණද එයට රාජ්‍ය බලය ලබා ගැනීමට තරම් ශක්තිමත් භාවයක් ඇති කර ගත්තේ පක්ෂය ගමන් ගත් සැලසුම්සහගත ගමන නිසාය.

2019 දී ජනතා විමුක්ති පෙරමුණ තවත් සංවිධාන සහ වියත් කණ්ඩායම් සමඟ එක්ව ජාතික ජන බලවේගය නිර්මාණය කළ අතර 2019 ජනාධිපතිවරණය සහ 2020 මහමැතිවරණය සඳහා ද ජාතික ජන බලවේගය තරග කළ ද සාර්ථකත්වය අත්පත් කර ගැනීම දුෂ්කර කාර්යයක් විය. එහෙත් අප වඩාත් සැලසුම්සහගත ලෙස අපගේ දේශපාලන ගමන් සිතියම නිර්මාණය කිරීමට කටයුතු කළ අතර එහි



ප්‍රතිඵලය වූයේ 2019 ජනාධිපතිවරණයේදී ලක්ෂ හතරකට මදක් වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් ජාතික ජන බලවේගය අවුරුදු හතරක් ඇවෑමෙන් මෙරට ඡන්ද දායකයන්ගෙන් ලක්ෂ පනස් හතකට ආසන්න පිරිසක් ලබාගත් ප්‍රධානම දේශපාලන බලවේගය බවට පත්වීම සුවිශේෂය. අසූනවය ඉල්මහේදී අළු දූවිලි බවට පත්වූ දේශපාලන පක්ෂයක් සහ 2019 දී සියයට තුනට වැටුණු දේශපාලන පක්ෂයක් මෙරට ආණ්ඩු බලය අත්පත් කරගත් දේශපාලන පක්ෂයක් බවට පත්වීම සැබැවින්ම විස්මය ජනකය. අප දැන් ආරම්භ කර තිබෙන්නේ පක්ෂය නඟාසිටවූ ආකාරයට රට ද නැවත නඟාසිටුවනු ලබන සටනයි.

**උදිත ගුණවර්ධන**
**ඡායාරූපය - වාසිත පටබැඳිගේ**

# මේ සමාජය වෙනසක් කළ හැක්කේ අපටමයි කියන හැඟීම එදා දැඩිව ඒත්තු ගියා

ජවිපෙ නිර්මාතෘ රෝහණ විජේවීර සමීපව ඇසුරු කළ 1971 අරගලයේදී මෙන්ම සහ 88-89 සමයේද ක්‍රියාකාරිකයෙකුව සිටි 60 දශකයේ අගභාගයේ සිට අද දක්වාම ක්‍රියාකාරී දේශපාලනයේ නිරත ජිනදාස කිතුලේගොඩගේ අත්දැකීම් ඇසුරින් මෙම ලිපිය සැකසිණි.



ජිනදාස කිතුලේගොඩ

1965 දී තමා මං විද්‍යෝදයට (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) එන්නෙ. ඒ කාලෙ අපේ බැච් එකේම පුංචිහේවා කියලා සහෝදරයෙක් හිටියා. එයා 67දී, 'අලුත් දේශපාලන ව්‍යාපාරයක්' තියෙනවා සෙට් වෙමුද කියලා ඇහුවා. හා හා බලමු කීවා මිසක් මං එච්චර උනන්දු වුණේ නෑ. ඇවිත් අවුරුදු දෙකක් විතරයි ගෙවිලා තිබුණේ. 1968 වෙද්දි වැඩිදෙනෙකු අතර මේ අලුත් දේශපාලන මතවාදය තියෙන බව දැනෙන්න ගත්තා. රහසිගතව තිබුණු සංවිධානයක් නිසා කවුරුත් ප්‍රසිද්ධියේ කීවෙ නෑ. 'ව්‍යාපාරය' කියල තමා කීවේ. හැට අටේදී අනුරාධපුරයෙන් කැම්පස් ආව පොඩි සෙනෙවි නම් ජූනියර් කෙනෙක් තමා ඉස්සරලාම මේ ගැන සාකච්ඡාවක් ගත්තෙ. පංති පහේ මූලික පංති හතරම කළේ ඒ කාලෙ තරුණ භික්ෂුවක් වෙච්චි නාරංබැද්දේ පියදස්සි හිමි. පසුකාලෙක කෑගල්ලෙන් පොදු පෙරමුණෙන් ඡන්දෙ ඉල්ලලා පළාත් සභා ගියපු ජගත් නාරංබැද්ද. පස්වෙනි පංතිය කළේ ප්‍රේමපාල හේවාබටගේ.

## කටුමැටි ගසා තිබුණු පුංචි පැල

1969 දී අපිව අධ්‍යාපන කඳවුරකට යැව්වා. හොරගොල්ලෙ සිරිමාවෝ බණ්ඩාරනායක නෝනගෙ පොල්වත්තක කටුමැටි ගසා තිබුණු පුංචි පැලක තමා ඒක තිබුණේ. එතැන ආරක්ෂිතයි. මුරකරු හැටියට හිටියෙ පක්ෂයේ සහෝදරයෙක්. මේ අධ්‍යාපන කඳවුර මෙහෙයවන ලද්දේ පියතිලක සහෝදරයා. එයා අප්‍රේල් මහ නඩුවේ 1 වෙනි විත්තිකරු. ඒ අධ්‍යාපන කඳවුරෙන් අධ්‍යාපනය හදාරලා හමාර වුණාට පසුව යා යුතු මාර්ගය මෙය බව ඇඟට දැනෙන්න ගත්තා. සමසමාජ, කොමියුනිස්ට් අය වැඩ කරමින් සිටින්නේ කොහොමද කියලා වඩාත් හොඳින් තේරුණා. නිවාඩුවට ගමේ ගියාම දේශපාලනයට නැඹුරු යාළුවොත් එක්ක කතා කරලා, වාද කරලා දිනන්න දැනුමක් ගන්න හිතාගෙන තමා මුලින්ම මේ සාකච්ඡාවලට ගියේ. ඒත් අධ්‍යාපන කඳවුරෙන් පසුව ඇත්තටම මේ සමාජය වෙනසක් කරන්න මැදිහත් වෙන්න ඕන කියන එක දැනුණා. ඒක කළ හැක්කේ අපටමයි කියන හැඟීම දැඩිව ඒත්තු ගියා.

1970 දී කැම්පස් එකෙන් අවුට් වුණු ගමන් විද්‍යාලංකාරයේ (කැලණිය විශ්වවිද්‍යාලය) ෆුල් ටයිම් වැඩ කරන්න කියලා ඉල්ලීමක් ආවා. එතැනදි මගේ නායකයා වුණේ පියසිරි කුලරත්න. මේ දවස්වල සංඝාරාමය අපේ යන එන, අධ්‍යාපන කඳවුරු තියන තැනක් බවට පත්වෙලා තිබුණා. විජේවීර සහෝදරයත් එතෙන්ට එනවා. පේරාදෙණියෙන් බෝපගේ එනවා. ඌව මහත්තයා හෙවත් උයන්ගොඩ එනවා. කාලා බීලා නවාතැන් අරන් පහුවදා යනවා. අප්‍රේල් 3 වෙනිදා පියතිලක සහෝදරයයි, ඌව මහත්තයයි ඇවිත් මං හිටපු කාමරයට තට්ටු කරලා, "මෙන්න මේක අරන් තියන්න" කියලා පාර්සලයක් දුන්නා. ඒක ඒ දෙන්නා 5 වෙනිදා ප්‍රහාරයේදී භාවිත කරන්න හිතාගෙන හිටපු යුනිෆෝම් දෙක. අපි පස් දෙනෙක් කැඳවලා ප්‍රහාරයට සූදානම් වෙන්න කීවා. මට රු.500ක් දීලා මේකෙන් තුවක්කුවක් ගන්න කීවා. ඒ කාලෙ තුවක්කුවක් ගන්න ඒ ගාණ හොඳටම ඇති. ප්‍රහාරයට සූදානම් වුණු පස්දෙනාගෙ කණ්ඩායම වුණේ සුනිල් රත්නසිරි ද සිල්වා, (මහ නඩුවේ 16 වෙනි විත්තිකරු) ෆෝස්ටර් බමුණුසිංහ, ජයසේන සහ විලී ගමගේ.

## මහරගම කේස් එක

බුලර්ස් රෝඩ් එකේ හමුදාපතිගෙ නිල නිවාසයට පහරදීම තමා අපි පස්දෙනාට පැවරුණු රාජකාරිය වුණේ. ඒ සඳහා ටින්වල අහුරන ලද බෝම්බ දෙක ගාණෙ 10ක් ලැබුණා. ඒත් කලින් දවසේ රෑ 10 වෙද්දි පහරදීම තාවකාලිකව නතර කරන්න කියලා පණිවුඩයක් ලැබුණා. වෙන කොහේ හරි තැනකට සම්බන්ධ වෙන්න කියලත් තිබුණා. ඒත් රෑ 11 විතර වෙද්දී ගල් බෝර පුපුරනවා වගේ සද්ද ඇහෙන්න ගත්තා. බලනකොට කට්ටියක් මහරගම පොලීසියට ගහනවා. එයාලට පණිවුඩේ ගිහින් නෑ. සංඝාරාමයේ තාප්පෙන් එහා පොලීසිය. අපිත් මේකට ගහන්න තීරණය කළා. තාප්පෙන් බහින්න හදද්දිම ඒ පැත්තෙන් උඩට වෙඩි තියනවා. මහරගම කේස් එක දන්න නිසා මේ පොලීසිය කලින්ම රෙඩි වෙලා. වැඩේ අසාර්ථක නිසා පාන්දර 4 වෙද්දි අපි එතැනින් පිටවෙලා යන්න ගියා. ඊට පස්සෙ මං හම්බන්තොට දිසා ලේකම් වෙලා හිටපු ඇන්ටිස් අයියා හම්බවෙන්න කතරගම ගියා. මඟදි බස් එක නවත්තලා චෙක් කරන්න ගත්තා. නෝනාගම හංදියේදී තරුණ අය බස් එකෙන් බස්සවනවා. එතැනදිම තරුණ අම්මා කෙනෙක් දරුවා පොඩ්ඩක් අල්ල ගන්න කියලා මට දුන්නා. මං එයාව වඩාගත්තා. දැන් මං පුංචි දරුවෙක් වඩාගත්තු තාත්තා කෙනෙක්නෙ. ඉතිං මං ගැන බලන්නෙ නැතුව අනිත් තරුණයින් ගැන විතරක් පොලීසියේ අවධානය යොමුවෙලා තිබුණා. මං ඊළඟ බස් හෝල්ට් එකෙන් බැස්සා. යන්න තැනක් නෑ. ඇඹිලිපිටියෙ මොරකැටියෙ අයියා කෙනෙක් හිටියා. පයින්ම එහෙට ගියා. මොනරාගල කැලෑව මැද්දෙ ඒ අය හේනක් කොටලා වාඩියක් ගහගෙන තිබුණා. එතැන අයියයි, එයාගෙ යාළුවෙකුයි, යාළුවගෙ යාළුවෙකුයි හිටියා. ඒ යාළුවගෙ කකුලේ ඇස්වට කළු වෙලා. ඒ කියන්නෙ එයා ව්‍යාපාරෙ කියලා මං දැනගත්තා. ඒත් අඟවන්න ගියෙ නෑ. අපි දෙන්නට දෙන්න ඒ ගැන මොකුත්ම කතා කරේ නෑ. මාස 2ක් විතර එතැන හිටියා.

## ප්‍රධාන නගරවල රැස්වීම්

76 දී හදිසි නීතිය ඉවත් කළාම ගමනායක, සිරි අයියා (සෝමවංශ අමරසිංහ) එළියට ඇවිත් පුවත්පත් සාකච්ඡාවක් තිබ්බා. ප්‍රධාන නගරවල රැස්වීම් තියන්න ගත්තා. 77 හත් හවුල් ආණ්ඩුවෙන් මැතිවරණයේදි දුන් පොරොන්දුවක් අනුව අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත අහෝසි කළා. ඒ නිසා රෝහණ සහෝදරයටත් එන්න හැකිවුණා. හිරගෙදරින් දෙන සරමයි සර්ට් එකයි විතරයි එයාට තිබුණේ. කලිසම් රෙදි නෑ. හරිම හිඟයි. සහෝදරයින්ගෙන් එකතු කරලා තමා කලිසමක් කමිසයක් අරන් දුන්නෙ. එතකොට මං බැංකුවෙ රස්සාවට ගිහින් වැඩ කරමින් හිටපු නිසයි, සමුපකාරෙක යාළුවෙකු හිටපු නිසයි මට කලිසම් 3ක් තිබුණා.

මේ කාලෙ මාව බැංකුවෙන් එහෙට මෙහෙට මාරු කරනවා. මාව රත්නපුරයට මාරු කරා. රත්නපුර හම්බන්තොට වගේ පැතිවල අපේ සාමාජිකයින් හිටියෙ නෑ. මුළු දිස්ත්‍රික්කෙටම හිටියෙ 3ක් හෝ 4ක්. බෝල්ෂෙවික් පක්ෂ ආකෘතියට අනුව කණ්ඩායමක 5 දෙනෙක් සිටිය යුතුයි. රත්නපුරේ 5ක් නෑ - කළුතරත් නෑ. ඊට පස්සෙ දිස්ත්‍රික්ක දෙකම එකතු කරලා තමා 5 දෙනෙකුගෙ කණ්ඩායම හැදුවෙ. රත්නපුරෙන් මමයි, ආනන්ද ගමගේ සහෝදරයයි ආවා. කළුතරින් එහි දිසා ලේකම් ලෙස කටයුතු කළ නිමල් කියලා සහෝදරයෙකුයි, බොරැල්ලේ රෙදි කඩයක් දාගෙන හිටපු වික්‍රම, බණ්ඩාරගම ධනෝරිස් අයියායි එක්ක තමා 5 දෙනා හැදුණේ. ගමනායක සහෝදරයා තමා ඇවිත් බෝල්ෂෙවික් කණ්ඩායම පිහිටෙව්වෙ. ඊට පස්සෙ ඇඹිලිපිටියට ගියා. ආයෙම 1982 වෙද්දි මාතරට මාරු කළා. මාතරදි රෝහණ සහෝදරයා නිතර හමුවුණා.

"රෝහණ සහෝදරයා මුලින්ම දැක්කෙ නුවරඑළිය උසාවියේදී. පළවෙනි වතාවට අත්අඩංගුවට පත්වෙලා නුවරඑළිය උසාවියට තමා දැම්මෙ. ඒ නඩුව කැඳවපු දවසේ අපි කට්ටියක් කෝච්චියේ ගියා. ඊට පස්සෙ විද්‍යෝදයේ 1970 ජූලි 4 දා "සී. අයි. ඒ. කාරයෝ" යනුවෙන් දේශනයක් පැවැත්වුවා. නිතර සංඝාරාමයට ආවා, ගියා. දවසක් ඇඹිලිපිටියෙ තිබුණු රැස්වීමකට යමින් ඉඳිද්දී, වැස්සට අහුවෙලා මඟදි තේ කඩේකට කොටුවෙලා හිටියා. ඔතැන ඉඳිද්දී ජීප් එකක් ගියා. ආයෙම රිවස් කරගෙන ආවා. ජීප් එකේ ඉස්සරහ රෝහණ සහෝදරයා. කොහෙද යන්නෙ අහලා, ඇඹිලිපිටියෙ රැස්වීමට කීවම 'යමු කියලා' මාවත් දාගෙන ගියා. ඇන්ටිස් අයියා විවාහ වෙද්දී අවුරුදු 42යි. අපි තමා මනමාලි බලන්න ගියේ. අත්සන් කරන්න ආවෙ රෝහණ සහෝදරයයි, දයා වන්නිආරච්චියි. ඒ වගේ තැන්වලදිත් ඔහු හමුවුණා. මාතරදි නිතර හමු වුණා."

## චීන කොමියුනිස්ට් පිලෙන් කැඩිලා

"ළඟින් ආශ්‍රය කරන්න කලින්ම මට රෝහණ සහෝදරයා ගැන ලොකු භක්තියක් තිබුණා. ඒ වෙද්දි එයා අවුරුදු 21ක කෙනෙක්. අපට අවුරුදු 21 වෙද්දි දේශපාලන වශයෙන් මෙලෝ දෙයක් දන්නෙ නෑ. ඒත්, ඔහු ලෝකයේ මේ වගේ සංවිධාන අධ්‍යයනය කරලා, මේ ව්‍යාපාරය බිහි කළා. ඒ තරම් අඩු වයසකින් දේශපාලන පරිණතභාවයට පත්වෙනවා කියන්නෙ ලොකු කාරණයක්. ලුමුම්බා විශ්වවිද්‍යාලයේ ගිහින් වෛද්‍ය උපාධිය අතෑරලා ඇවිත් දේශපාලනය කරනවා කියන්නෙ වෙනම ගැම්මක්. සල්ලි බාගෙ නෑ. හිතේ තියෙන ධෛර්ය, දැනුම එකතු කරලා මේ වගේ වැඩක් කළ යුතුයි කියලා එන අදහසම ඇති ඔහු මොන වගෙ කෙනෙක්ද කියලා තේරුම් ගන්න. අපි ඔහුට ආකර්ෂණය වුණේ ඒකයි. ඒ වගේ ළාබාල කාලයකදී එහෙම නම් ඉදිරියේදී කොහොම වෙයිද හිතුණා. ඒක විශ්වාසයක්. භක්තියක්. ඒ නිසාම මොන විදිහකටවත් අතාරින්න හිතුණෙ නෑ. චීන කොමියුනිස්ට් පිලෙන් කැඩිලා පක්ෂ ගණනාවක්, සංවිධාන ගණනාවක් හැදුණා. දැන් කවුරුවත් නෑ. මේ දක්වාම එන්න මේ ව්‍යාපාරයට හැකි වුණේ ඒ අද්විතීය නායකත්වය නිසයි."

80 ගණන් වන විට ජේ.ආර්. නම් නරුම පාලකයා එයාලා කරපු අපරාධ ටික වහගන්න, ඒවා අපේ පිට දාලා 83 වෙද්දි අපේ පක්ෂය තහනම් කරනවා. ඒ තහනමත් සමඟ ඉහළ මට්ටමේ හිටපු බොහෝ දෙනෙක් පක්ෂය දාලා යනවා. පක්ෂයේ මධ්‍යම කාරක සභාව පවා සෝදාපාළුවට ලක්වෙනවා. පක්ෂයේ මධ්‍යම කාරක සභාවට සාමාජිකයින් තෝරා ගනිද්දී අඩුම ගාණේ අවුරුදු 2ක් වත් පූර්ණ කාලීනව දේශපාලනය කරලා තිබිය යුතුයි කියලා රෝහණ සහෝදරයා කියලා තිබුණා. අනික් අතට මධ්‍යම කාරක සභාවේ ඉතුරු වෙලා හිටපු අය වෙලාවක් අවේලාවක්, නින්දක් නැතිව එක දිගට වැඩ. එළියේ වෙන්නෙ මොනවද කියලා බොහෝ දෙනෙක් දන්නෙ නෑ. මේ නිසා එළියේ වන සිදුවීම් වටහා ගන්න හා වාර්තා කරන්න හා දැනුම්වත්වීමට පූර්ණ කාලීන නොවන උගත් බුද්ධිමත් කණ්ඩායමක් මධ්‍යම කාරක සභාවට එකතු කරගන්න තීරණය කරනවා. මතුගම අගලවත්තෙ තමා ඔය සාකච්ඡාව තිබුණේ. මමයි, මහාචාර්ය අතුල සුමතිපාල (ඒ වෙද්දි මහාචාර්ය නෙවෙයි) සත්‍යපාල වන්නිගම, ඔරුවල වානේ සංස්ථාවෙ වැඩ කළ සුනිල් චන්ද්‍රසිරි සහ ඒකෙම වැඩ කළ තවත් අයෙක් මේ සාකච්ඡාවට යනවා. ගමනායක සහෝදරයා තමා ඒ සාකච්ඡාව මෙහෙයවූවේ. ඒ හතර දෙනාම මේ වගකීම දරන්න අපි සුදුසු නෑ කියලා කීවා. මගෙන් පුළුවන්ද බැරිද ඇහුවෙත් නෑ. මං ඔහේ හිටියා. ෆුල් ටයිම් නොවන වෙනත් රස්සාවක් කරන ගමන් මධ්‍යම කාරක සභාව නියෝජනය කළ එකම කෙනා මම.

## ගුණසිංහපුර බස් ටැන්ඩ් එක

1983 පක්ෂ තහනමෙන් පසුව මට රෝහණ සහෝදරයා මුණ ගැසුණේම නෑ. 89 වෙද්දි මං ලංකා බැංකු සේවක සංගමයේ එන්.එස්.බී. ශාඛාවේ සභාපති. ඉතිං වෘත්තීය සමිති කටයුතුවලට මං රාජකාරිවලින් නිදහස් කරලා තිබ්බෙ. දවසක් උදේම මගේ ගමේ පරණ මිත්‍රයෙක් ආරංචියක් අරන් ආවා. එයා කීවා රෝහණ සහෝදරයා උලපනේ පැත්තෙ ඉඳලා අහුවෙලා කියලා. එයාගෙන් ප්‍රකාශයක් අරන් ඝාතනය කරලා කියලා. මං මේ ආරංචිය විශ්වාස කළේ නෑ. ඒත් මේ යාළුවාත් ඇතුළත්ව කට්ටිය එක්ක වාද කරන්න දැනුම ගන්න තමා මං මුලින්ම පක්ෂයට සම්බන්ධ වුණේ. මෙයා ඒ කාලෙ හිටියේ මහින්ද රාජපක්ෂත් එක්ක. "මං මහින්ද මහත්තයා එක්ක ඉඳිද්දී ගෝඨාභය මහත්තයාගෙන් කෝල් එකක් ආවා. එයා තමයි මහින්ද මහත්තයට කීවෙ" කියලා මේ යාළුවා කීවා. ඒ සැරේ මං ටිකක් ගැස්සුණා. මේ වෙද්දි ගුණසිංහපුර බස් ටැන්ඩ් එකේ බත් කඩේක උඩම තට්ටුවෙ අපට කාමරයක් තිබුණා. විජේදාස ලියනාරච්චි සහෝදරයට නතර වෙන්න ගත්තු කාමරේ. ලියනාරච්චි ඝාතනය වුණාට පස්සෙ තංගරාජා නතරවෙලා හිටියේ එතැනයි. එයා මධ්‍යම කාරක සභාවෙ හිටිය නිසා ලැබුණු තොරතුර එයාට කීවා. එයත් විශ්වාස කළේ නෑ.

**1983 පක්ෂ තහනමෙන් පසුව මට රෝහණ සහෝදරයා මුණ ගැසුණේම නෑ. 89 වෙද්දි මං ලංකා බැංකු සේවක සංගමයේ එන්.එස්.බී. ශාඛාවේ සභාපති. ඉතිං වෘත්තීය සමිති කටයුතුවලට මං රාජකාරිවලින් නිදහස් කරලා තිබ්බෙ. දවසක් උදේම මගේ ගමේ පරණ මිත්‍රයෙක් ආරංචියක් අරන් ආවා.**



ඔළුව අවුල් වුණු මං පාරේ එහා මෙහා ඇවිදිද්දී, රේඩියෝ එකේ නිවුස් එක විශේෂ නිවේදනයක් හැටියට යනවා. ඊට පස්සෙ මං ආයෙම දුවලා ගිහින් තංගට කීවා. තංග ඇඬුවා. අධිකාරි කියල කෙනෙක් තමා රෝහණ සහෝදරයා ඉන්න තැන පෙන්නල තියෙන්නෙ. අධිකාරි මෙතෙන්ට ඇවිත් තියේද ඇහුවම දෙතුන් දවසක් ඇවිත් තියේ කියලා තංගා කීවා. එහෙනම් වහාම පිටවෙන්න කියලා මං තදින් කීවම එයා අතට අහුවුණු ඇඳුම් කැඩුම් ටිකත් අරන් පිටත් වුණා. සිරි අයියා, (සෝමවංශ අමරසිංහ) හෙට උදේ 8 වෙද්දි මෙතෙන්ට එනවා කියලා තංගා කියාගෙනයි ගියේ. ඊට පස්සෙ සිරි අයියා මෙතෙනට නැවිත් මඟ නවත්තා ගන්න ඕන විදිහට ප්ලෑන ගහන්න මට සිද්ධ වුණා. පහුවදා මේ ආරංචිය සිරි අයියට දෙන්න යද්දිත් එයා දන්නෙත් නෑ. වාහනයට නැගලා කතාව ඔක්කොම කියවල ඉවර වෙනකල් බොරැල්ල, ටවුන්හෝල්, තුම්මුල්ල, බම්බලපිටිය වගේ පැය 2ක් විතර කොළඹ වටේ රවුම් ගැහුවා. කතාව ඉවර වුණාම පක්ෂ සම්බන්ධකම්, ඥාති සම්බන්ධකම් සියල්ල තාවකාලිකව නවත්වන්න ඕන කියලා අපි එකඟ වුණා. මං සිරි අයියගෙ කාර් එකෙන් බැහැලා, පේමන්ට් එකේ ඇවිදගෙන එද්දී හවස ජනතා පත්තරේ ඇවිත්. ඒකෙ මුල් පිටුවෙ ගමනායකත් අත්අඩංගුවට අරන් මරා දාපු පුවත පළවෙලා තිබුණා.

## කතරගම කිරිවෙහෙර ගාව

ටික දවසකට පස්සෙ නාමල් කියලා සහෝදරයෙක් ඇවිත් මාව හම්බවුණා. සිරි අයියා ගැන නම් ආරංචියක් නෑ. සමන් පියසිරි, ලලිත් විජේරත්න, ශාන්ත බණ්ඩාර ඉන්න බව දන්නවා කියලා. මට ඒ අයගෙන් කෙනෙක් මුණගස්වන්න කියලා මං කීවා. මොකද ඒ තුන්දෙනාම දේශපාලන මණ්ඩලය නියෝජනය කරන අය. ලලිත් විජේරත්න මුණගස්වන්නම් කියල ඒ සහෝදරයා කීවා. ඊට පස්සෙ මං ලලිත් සහෝදරයා එක්කගෙන ගිහින් සිරි අයියව මුණගැස්සුවා. නොවැම්බර් මාසයේදි රෝහණ සහෝදරයා අහුවුණේ. මේ දෙසැම්බර්. මං දෙසැම්බර් මාසයේ අග ජ'පුර හොස්පිට්ල් ඇඩ්මිට් වුණා. මගේ ස්නායු සම්බන්ධ පොඩි ලෙඩක් ඇවිත් තිබුණා. වාට්ටුවෙදි රේඩියෝ නිවුස්වලදි අර තුන්දෙනෙක් අත්අඩංගුවට පත්වුණා කියලා ප්‍රචාරය වුණා. සිරි අයියත් අහුවුණාද කියලා මට සැක හිතුණා. මොකද ඊට දවසකට කලින් විජේරත්න එක්කරගෙන ගිහින් මුණගස්වපු නිසා. මං පහුවදා ටිකට් කප්පවාගෙන ගිහින් සිරි අයියා හම්බවෙලා විස්තරේ කීවා. දැන් ඔයා යන්න කියලා මං කීවා. ඒ ගමන් යාළුවෙක් ගෙන්වගෙන මාව කඩවතින් දාලා එයා ගියා.

ඊට පස්සෙ මාර්තු මාසෙ 1 ,10, 20 කතරගම කිරිවෙහෙර ගාවට එන්න කියලා සිරි අයියා මට පණිවුඩයක් තියලා තිබ්බා. මං දවස් තුනේම ගියා. මිනිහා නෑ. ඊට පස්සෙ හම්බන්තොට ඉතුරුවෙලා ඉන්න අය එක්ක සම්බන්ධීකරණය කරගන්න උත්සාහ ගත්තා. හම්බන්තොටදි මහේෂ් හරහා ගාල්ල, මාතර, කළුතර සම්බන්ධතා හැදුණා. ඒ වෙද්දි කැලෑවෙ මෙනේරි හේනක වාඩියක තමා මං නතර වෙලා හිටියෙ. එතෙන්ට සහෝදරයෙක් සිරි අයියගෙ ලියුමක් අරන් ආවා. ඒකෙ තිබුණෙ මනුස්සයා රටින් පිටවුණු බව. ඊට පස්සෙ මං 90 නොවැම්බර් කොළඹ ආවා. ඒ වෙද්දි කොළඹ සියලු තැන් හෙළිදරව් වෙලා. සෝමවංශගේ සම්බන්ධකම් තියෙන්නෙ මටයි කියලා ආරංචි ගිහින් තිබුණා. ඒ වෙද්දි මං ළඟ තිබුණු ඇඩ්‍රස්, තොරතුරු තෝරලා විනාශ කරලා අනුරාධපුරේට පනින්න හිතාගෙන හිටියත්, මගේ වැඩ ටික දවසෙන් ඉවර කරගන්න බැරිවුණා. යන්නෙ හෙටයි කියලා ඉඳිද්දී අමරසිංහ කියලා මං ඉන්න තැන දන්න සහෝදරයෙක් එක්කම ආරක්ෂක අංශ ඇවිත් දොරට තට්ටු කළා.

## "කිතුලෙ කියන්නද විපුලෙ කියන්නද? කන ළඟට පිස්තෝලෙ තද කරලා එක්කෙනෙක් ඇහුවා.

මාසයක් විතර තාවකාලික රැඳවුම් කඳවුරක් කරල තිබුණු ගල්කිස්ස පැත්තෙ හෝටලයක නවත්වාගෙන හිටියා. සති කීපයකින් වැලිසර නේවි කෑම්ප් එකට ගෙනිච්චා. එතැනින් තෙලවලට ගෙනිච්චා. ඊටත් පස්සෙ මැගසින් බන්ධනාගාරයට. ඒකෙ අවුරුදු 4ට කිට්ටු කාලයක් හිටියා. චෝදනා නැති නිසා මං නඩු දැම්මා. 93 අග හෝ 94 මුල මං නිදහස් වුණා. ඉතින් තාමත් මම අපි තෝරාගත් දේශපාලනය අත්නොහැර කරමින් ඉන්නවා.

▶ ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර

# හෙට බැහැර යෑමට සිටි ගමනායක අද මරා දැමූ හැටි



**ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ මෙන්ම නායක රෝහණ විජේවීර සහ පක්ෂයේ මහලේකම්ධුරය දැරූ උපතිස්ස ගමනායක යන දෙදෙනා ඝාතනයට ලක්වී අදට වසර 35ක් සම්පූර්ණ වේ.**

රෝහණ විජේවීර ජනතා විමුක්ති පෙරමුණ ආරම්භ කළ සමයේ පටන් ඔහු සමග සිටි අයකු ලෙස උපතිස්ස ගමනායක හැඳින්වේ. ජවිපෙ වෙනුවෙන් දිවිය කැප කළ උපතිස්ස ගමනායකගේ බිරිඳ වන කරුණා ගමනායක ද එකල ජවිපෙ සාමාජිකාවකි. ඇය මේ වන විට එංගලන්තයේ ලන්ඩන්හි ජීවත් වන්නීය.

71 අරගලයෙන් පසු අත්අඩංගුවට පත්වූ හා භාර වූ කැරලිකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා දිවයින පුරා කඳවුරු පිහිටුවීමට සිරිමාවෝ ආණ්ඩුව පියවර ගෙන තිබිණි. මේ පුනරුත්ථාපන කඳවුරුවලට යමින් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන්ගේ සැපදුක් සොයා බැලීම සහ ඔවුන් සමග යළි දේශපාලන සබඳතා ගොඩනගා ගැනීමට ගමනායක වෙහෙස නොබලා කටයුතු කළේය. සිය අනාගත සහකාරිය ඔහුට හමුවන්නේ මෙලෙස කඳවුරකට ගිය ගමනකිනි. කඳවුරේ සිටින පුද්ගලයන්ගේ ඥාතියෙක් ලෙස පෙනී සිටිමින් නිතර නිතර මීරිගම කඳවුරට පැමිණි ගමනායක හා කරුණා අතර ප්‍රේම සම්බන්ධයක් ඇතිවූ අතර එය කෙළවර වූයේ විවාහයෙනි.

1976 දී හදිසි නීතිය ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නිදහස් වූ විජේවීර, සිය සහෝදරවරුන්ට උපදෙස් එවා තිබුණේ වහාම පුවත්පත් සාකච්ඡාවක් පවත්වා පක්ෂයේ නිල අයිතිය රැක ගන්නා ලෙසය. මේ අනුව 1977 පෙබරවාරි මස ජවිපෙ වැඩබලන ප්‍රධාන ලේකම්වරයා ලෙස උපතිස්ස ගමනායකගේ ප්‍රධානත්වයෙන් පුවත්පත් සාකච්ඡාවක් පවත්වන ලදි. එසේ ජවිපෙ නිල අයිතිය තහවුරු කර ගන්නා ලද්දේ උපතිස්ස ගමනායක විසිනි.

විශේෂයෙන් පක්ෂ තහනමෙන් පසුව රහසිගත දේශපාලනයේ නියැළෙමින්, මර්දනයට මුහුණ දුන් 87 කාල පරිච්ඡේදයේ දී විජේවීරයන් නොයෙක් අවස්ථාවන්වලදී උපතිස්ස ගමනායක විසූ බණ්ඩාරගම රහසිගත නිවෙසට දේශපාලන සාකච්ඡා සඳහා පැමිණ තිබේ. ඒ පිළිබඳ මතකය කරුණා ගමනායක සිහි කරන්නේ, මෙසේය.

“රෝහණ සහෝදරයා, ඇත්තෙන්ම ඔහු අපට වඩා බොහෝ ඉදිරියෙන් සිටි පරම්පරා තුනකට නායකත්වය දුන් මිනිසෙක්. දේශපාලනය ගැන පමණක් නොවෙයි හැම විෂයයක් පිළිබඳවම ඔහුට තිබුණේ පුදුමාකාර දැනුමක්. අනුහස් සහිත අසහාය මිනිසෙක් යැයි කීම නිවැරදියි. යමක් වෙන්න කලින් ඉදිරිය පෙනීමේ ගුණය ඔහුට තිබුණා. ඔහු කලින් කියූ දේ අද වන විට සනාථ වී තිබෙනවා. එදා ආණ්ඩු නිර්මාණය කළ භීෂණය පවා ඔහු කලින්ම තේරුම් ගෙන තිබුණා. තමන් නිවැරදි යැයි සිතන දර්ශනය ගැන අනුපමේය කැපවීමක් ඔහුට තිබුණා. මේ රට බිහිකළ විශිෂ්ටතම පූර්ණකාලීන විප්ලවවාදියා රෝහණ සහෝදරයායි. ඒ ගරුත්වය කිසිවෙකුට කෙලෙසන්න බැහැ.”

රහසිගත දේශපාලනයේ නියැළෙමින් බණ්ඩාරගම මහවිල ග්‍රාමයේ නිවෙසේ සරුසාර සිල්ලර කඩයක් සහ රෙදි මහන වෙළෙඳාමක් ද උපතිස්ස ගමනායක පවුල විසින් කරගෙන යන ලදි. මහවිල ගමේ උපතිස්ස ගමනායක ප්‍රකටව සිටියේ ඩයස් මුදලාලි යන අන්වර්ථ නාමයෙනි. පක්ෂයේ ඉහළ පෙළේ සාමාජිකයන් කීප දෙනෙකු හැරුණු විට විජේවීර සහ ගමනායක රහසිගතව පදිංචිව සිටි ස්ථානයන් පිළිබඳ කිසිවෙකු දැන සිටියේ නැත.

“රෝහණ සහෝදරයා මහා බරපතළ ප්‍රශ්න මැද්දෙත් හරි සැහැල්ලුවෙන් හිටි කෙනෙක්. ඔහු දරුවන්ට හරියට ආදරය කළා. තමන්ගේ දරුවන්ට විතරක් නෙමෙයි අනුන්ගේ දරුවන්ටත් එයා හරි ආදරෙයි. දරුවන්ට නිවහල් රටක් උදා කර දෙන්නයි මහන්සි වුණේ.” කරුණා ගමනායක කියන්නීය.

ජනතා විමුක්ති පෙරමුණ තහනම් දේශපාලනයේ යෙදී සිටින විට සතුරු ආණ්ඩුව විසින් මර්දනය දියත් කරන ලද අවස්ථාවන්වලදී රෝහණ විජේවීරයන් සමග නොවෙනස් වූ අරමුණක සිට අනෙක් සහෝදරයන් මෙන්ම පක්ෂය වෙනුවෙන් උපතිස්ස ගමනායක ද කැප විය. ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් විවිධ අසත්‍ය චෝදනා, අවලාද, නිවේදනයන් නිකුත් කරද්දී, විජේවීර හා ගමනායක සුසංයෝගය ඒවා අසත්‍ය චෝදනාවන් බව රහසිගත කැසට්පටවලින් කතා පවත්වා ජනතාව අතරට යැවූහ.

“ජවිපෙ දෙකක් නැහැ. තියෙන්නේ එකයි. ඒ තමයි ආදරණීය රෝහණ විජේවීර සහෝදරයා නිර්මාණය කළ ජවිපෙ. එය අදත් හෙටත් කවදාටත් එහෙමයි.”යනුවෙන් ගමනායක ස්ථිර හඬින් 1988 දී විජේවීර සමග රහසිගතව කැසට්පටයට පටිගත කළේ, මහවිල නිවෙසේදීය. විජේවීර ගමනායක සහෝදරයන් අතර විශාල ළෙන්ගතුකමක් සහ බැඳීමක් තිබුණා.



කරුණා ගමනායක

විජේවීර හා ගමනායක දෙදෙනා අවසන් වරට හමුවන්නේ පේරාදෙණියේ ගලහ පාරේ ජනතා විමුක්ති පෙරමුණ රහසිගතව පවත්වාගෙන ගිය නිවෙසේදී. ඒ 1989 නොවැම්බර් 11 දින පැවැත්වුණු දේශපාලන මණ්ඩල සාකච්ඡාවේදී.

1989 නොවැම්බර් 12 වැනිදා දහවල් 1.00ට බ්‍රිගේඩියර් ජානක පෙරේරා සහ කර්නල් ගාමිණී හෙට්ටිආරච්චි ඇතුළු හමුදා කණ්ඩායමක් විසින් විජේවීරව උලපනේදී අත්අඩංගුවට ගන්නා ලදී. ඔබ්ස් කොම්බයින් නම් විශේෂ හමුදා කණ්ඩායම ප්‍රථමයෙන් පැමිණියේ ගලහ නිවෙසටය. උදෑසන නිවෙසින් බැහැරව යෑමට සූදානම්ව සිටි පියදාස රණසිංහ, එච්.බී. හේරත් එහිදී අත්අඩංගුවට පත්වූහ. පස්වරු 1ට පමණ වන විට ඔවුන් උලපනේ සෙන්ට් මේරිස්හි විජේවීර පදිංචිව සිටි නිවෙසට පැමිණියේ හමුදා භටයකු විසින් පදවනු ලැබූ පියදාස රණසිංහ පාවිච්චි කළ මෝටර් රථයෙනි. එම මෝටර් රථය නිවෙසේ අයට අමුත්තක් නොවීය.

ගම්පොළ උලපනෙන් පිටත්ව උපතිස්ස ගමනායක බණ්ඩාරගම මහවිල නිවෙසට පැමිණියේ 11 වැනිදා රාත්‍රියේදීය. 12 වැනිදා උදෑසන ඔහු නිවෙසින් පිටත්ව ගියේ යොදාගෙන තිබූ පක්ෂයේ කිසියම් සාකච්ඡාවක් සඳහාය. දහවල් ඔහු නැවත නිවෙසට පැමිණෙන විට වේලාව දහවල් 1ට පමණ වන්නට ඇත. දිවා ආහාර ගැනීමෙන් පසු යම් කැලඹීම් ස්වභාවයකින් ඔහු සිට ඇත.

සෝමවංශ අමරසිංහ පක්ෂ තහනමින් පසු සිරි අයියා නම භාවිත කළ අතර පසුව එම නම ද ඉවත් කර රිචඩ් යන

## දඩයම ලුහුබැඳ ගිය පිරිස ඩයස් මුදලාලි යනුවෙන් මහවිල ග්‍රාමයේ පෙනී සිටි උපතිස්ස ගමනායකව අත්අඩංගුවට ගත්හ.

නම භාවිත කළේය. 11 වැනිදා නිවෙසට පැමිණි අවස්ථාවේ ගමනායක කරුණා සමග පවසා ඇත්තේ දින කිහිපයකින්ම රිචඩ් ගැන ආරංචියක් නැති බවය.

“එහෙනම් ඇයි තවත් බල බල ඉන්නේ. මෙතැනින් ඉවත් වෙන්න ඕන නේදැයි” කරුණා විමසා ඇත. ගමනායක ඊට පිළිතුරු දී ඇත්තේ තමා හෙට බැහැරව යෑමට තීරණය කර ඇති බවය.

1989 නොවැම්බර් 13 වෙනිදා සවස උපතිස්ස ගමනායකගේ බිරිඳ කරුණා ගමනායක ඇඳුම් මහන කාමරයේ කිසියම් කටයුත්තක නිරතව සිටියාය. සිවිල් ඇඳුමෙන් සැරසුණු ආරක්ෂක අංශ ඔවුන්ගේ නිවෙසට කඩා වැදුණේ ඒ මොහොතේය. නිවෙසේ සිටියේ ගමනායකත් බිරියත් අත්උදව්වට සිටි පුෂ්පිකාත් පමණි. 9 හැවිරිදි දියණියත්, 6 හැවිරිදි පුතාත් ඒ වනවිට සිටියේ අමතර පන්ති පැවැත්වෙන නිවෙසකට ගොසිනි. ආරක්ෂක අංශ නිවෙසට ඇතුළු වන විට කරුණා ගමනායක පිටුපස දොරටුවෙන් එළියට පැනගෙන තිබිණි.

දඩයම ලුහුබැඳ ගිය පිරිස ඩයස් මුදලාලි යනුවෙන් මහවිල ග්‍රාමයේ පෙනී සිටි උපතිස්ස ගමනායකව අත්අඩංගුවට ගත්හ. හමුදාව පිටත්ව ගියේ ගමනායකගේ මෝටර් රථයේම ඔහුව නංවා ගෙනය.

විප්ලවය වෙනුවෙන් ජීවිතය පුද කළ ගමනායකගේ වචනයෙන්ම මෙය අවසන් කරමු.

“විප්ලවවාදියෙකුට ජීවිතයේ තිබෙන්නේ අවස්ථා තුනයි. විප්ලවවාදියා එක්කෝ අරගල භූමියේ සිටිය යුතුයි. නැතහොත් ඔහු සිපිරි ගෙයක සිටිය යුතුයි. අරගල භූමියේ හෝ සිරගෙදර නොසිටින විප්ලවවාදියා ජීවතුන් අතර ද නොසිටිය යුතුයි.”

**එම්. තාරික්**

**ඔවුන්ට සැබෑ කර ගන්නට සිහිනයක් තිබිණි. එය සාමූහික සිහිනයක් විය. බොහෝ දෙනකු තමන්ගේ පෞද්ගලික සිහින සැබෑ කර ගන්නට එකිනෙකා පරයමින් දුවයන විට, ඔවුහු තමන් විශ්වාස කළ 'මහා සිහිනය' සැබෑ කර ගන්නට වෙහෙස වූහ. හරි හැටි කුසට බතක්, ගතට වතක්, නෙතට නින්දක්, ඉහට වහලක් නොමැතිව දිගු ගමනක් ඇරඹූහ. කෙළවරක් නොමැති නින්දා අපහාස වින්දහ. අවසානයේ අපේක්ෂාවක් අත්හැර නොගනිමින්, දහසක් වධ වේදනා විඳ අභීතව මරණය වැලඳ ගත්හ.**



එදා විජේවීර ඇතුළු පිරිස

# අරුණෝදය බොහෝ දුර වූයේ නැත!

එදා 1987 – 89 භීෂණ සමයේ ඝාතනයට ලක්වූ සියලු දෙනා පිළිබඳව ඔවුන්ගේ සමීපතමයන්ගේ මතක තවමත් උණුසුම්ය. එදා ඝාතනයට ලක්වූ හෝ අතුරුදන් වූ අභීත මිනිසුන් කල්පනා කළේ කෙසේ ද? ඔවුන් එතරම් අසීරු මාවතක ඇවිද ගියේ මක්නිසා ද? මරණය පෙනි පෙනී අරමුණු අත්නොහැරියේ කුමක් හෙයින් ද?

එදා අරගලයේ මාදිලිය කුමක් වීද? රාජ්‍ය මර්දනය හමුවේ, නොසැලී සටන් වදින්නට ඔවුන් මෙහෙයවූයේ කෙබඳු සමාජ, දේශපාලන කොන්දේසි ද? ඒවා වටහා ගන්නට, ඔවුන්ගේ අරමුණු, විශ්වාසයන් විනිවිද දකින්නට ඔවුන්ගේම ලිඛිත, කථන භාෂණයන්ට සවන් දීම වඩාත් සාධාරණ විනිශ්චයකට මඟක් විය හැකිය.

මේ අප හමුවේ ඉතිරි වී ඇති එබඳු වැදගත් ලිඛිත සාක්ෂියකි. එය කවියකි! වඩාත් කුතුහලය දනවන කරුණ එය ඉංග්‍රීසි බසින් රචනා වීමය.

මේ කවියේ මාතෘකාව 'The Sunrise - far away' ය. ඒ නිමැවුම පිළිබඳ මා සම්බන්ධ වන අතීත කතාව කිසි දිනක මා හෙළි කර නැත. අද පළමුවරට හෙළි කරන්නේ ඒ සංවේදී කතා පුවතයි.

එය 1989 අවුරුද්දේ උඳුවප් මාසයේ යම් දිනයක් බව මතකය. ඒ වනවිට ජවිපෙ නායක 'රෝහණ විජේවීර' සහෝදරයා ඇතුළු බොහෝ නායකයෝ ඝාතනයට ලක්ව සිටියහ.

'රෝහණ විජේවීර' ඝාතනය කිරීමේ පුවත මගේ නෙත ගැටුණේ ලේක්හවුස් ආයතනයට ආසන්න, එවකට 'ලෝක වෙළෙඳපොළ' නමින් හැඳින්වූ ස්ථානය පසු කළ විට ඇති බස් නැවතුම්පොළ ආසනයේය. එහි පත්තර තට්ටුවේ එකල සවස් භාගයේ නිකුත්වන 'ජනතා' පුවත්පතේ මෙවැනි සිරස්තලයක් පළව තිබිණි.

**'විජේවීර අල්ලයි'**

එහි විජේවීර සොයුරාගේ සේයාරුවක් ද විය. මා සමඟ ගමන් කරමින් සිටියේ කම්කරු නායකයකු වූ 'ගීතරත්නය'. ඔහු 1990 මුල් භාගයේ අතුරුදන්වූවන්ගේ ලැයිස්තුවට එක්විය.

මඳක් කළු, තරබාරු සිරුරින් යුතු 'ගීතේ' පත්තරය දෙස මොහොතක් බලා, සැහැල්ලුවෙන් මෙසේ කීවේය.

**"මේක හෙණ පචයක්! මේක වෙන්න බැරි දෙයක්."**

ඔහු එසේ කීව ද මගේ යටි සිත මඳක් සසල විය. දින කිහිපයක් යන විට බොහෝ දෙනෙකුට ඒ පුවත විශ්වාස කිරීමේ අම්හිර විඳ දරා ගන්නට සිදු විය.

යළිත් කවිය දෙසට සිත් යොමු කළහොත්, එය මට දකින්නට ලැබුණේ සමූල ඝාතනය සිදුවුණු ඒ කාලපරිච්ඡේදයේදීය. දවසින් දවස දන්නා හඳුනන සොයුරු සොයුරියන් නොසිතූ හෝරාවන්හි අත්අඩංගුවට පත්ව හෝ අතුරුදන්ව තිබිණි. තවදුරටත් සංවිධාන කටයුතු කරගෙන යාම අතිශය අවදානම් විය. රැය ගත කරන්නට තැනක් නැතිවිය. නමුත් අපගේ සංවිධායක සහෝදරයා වූ ඔහු තවමත් අප මුණගැසීම අත්හලේ නැත. අපි ඔහු හැඳින්වූයේ වටවල මහත්තයා ලෙසය. සහෝදරයා කියා ප්‍රසිද්ධියේ පැවසීම මරණ වරෙන්තුවක් වූ අපි ඒ වෙනුවට මහත්තයා යන වචනය යොදා ගතිමු. ඔහුට තිබුණේ

එදා 1987 – 89 භීෂණ සමයේ ඝාතනයට ලක්වූ සියලු දෙනා පිළිබඳව ඔවුන්ගේ සමීපතමයන්ගේ මතක තවමත් උණුසුම්ය. එදා ඝාතනයට ලක්වූ හෝ අතුරුදන් වූ අභීත මිනිසුන් කල්පනා කළේ කෙසේ ද?

බෙහෙවින් ප්‍රියමනාප පෙනුමකි. පැහැපත් සිරුරකට හිමි ඔහුගේ වයස තිස් පහකට ආසන්න විය හැකිය. මැදුම් සිරුරක් ඇති ඔහුට බොකුටු කෙසේ කලඹක් තිබිණි. වම් හෝ දකුණු කම්මුලේ තරමක් කළු පැහැති ඉන්නෙක් විය. ඔහු පැලඳි උපැස රත් පැහැ රාමුවකින් සමන්විත විය. නිතරම මැනවින් හැඳ පැලඳි ඔහු රන් මාලයක් ද ගෙල පැලඳ සිටියේය.

අප රන් මාලය දෙස විමසිල්ලෙන් බලන විට ඔහු මඳක් සිනාසී මෙසේ කී බව මතකය.

**"මගේ ඉඳුල් කටගාන දවසෙ, අම්මා මේක දාල තියෙන්නෙ"**

එක් දිනක් හමුවූ විට වෙනදා පුරුදු සැහැල්ලුව ඔහු තුළ දක්නට නොතිබිණි. සමුගන්නට පෙර යමක් මතක් වූ විගසය. ඔහු මෙසේ කීවේය.

**"ඔයාට දෙයක් දෙන්න තියෙනවා."**

**" ඒ මොකක්ද?"**

ඔහු සිනාසී සාක්කුවෙන් අටට පමණ නැවූ කොටුරුල් කොළයක් ගත්තේය. එය මා අතට පත් කළේය. එය දිග හැර බලන විට ඉංග්‍රීසියෙන් ලියූ කවියක් බව මට පැහැදිලි විය. වික්ෂිප්ත වූ මම මෙසේ කීමි.

**"මට එච්චර ඉංග්‍රීසි තේරෙන්නෙ නැහැ."**

**"ඒකට කමක් නැහැ. ඉස්සෙල්ල මේක ඔයාගෙ අකුරින් ලියා ගන්න. පස්සෙ කාලෙක මේක සිංහලෙන් ලියන්න බලන්න. ඔහේ හොරෙන් හොරෙන් නෑනට කවි ලියන බව මං දන්නවා."** (මගේ මුහුණ විලියෙන් රතුවිය.) එදා යන්නට මත්තෙන් මම ඔහුගෙන් මෙසේ ඇසිමි.

**"ඇත්ත කියන්න මේක ඔයා නේද ලිව්වෙ?"**

**"අපොයි නැහැ. මං නෙවෙයි."** ඔහු පැනය මග හැරියේය.

මම හැකි ලෙස මගේ කැත ඉංග්‍රීසි අකුරින් එය ලියා ගතිමි. පසුකලෙක ඉංග්‍රීසි ගුරුවරයකු වූ මා පියාණන්ගේ උදව්වෙන් එය පරිවර්තනය කළෙමි. ඊටත් පසුව 'චන්දිමා නිශ්ශංක' පරිවර්තනයට උදව් කළාය. එකල 'රාවය' කවි පිටුවේ

**"පද්ම තටාකයේ"** පළ කරන්නට මගේ කැත අත්අකුරින් තිබූ ඉංග්‍රීසි කවිය **'චන්දිමාගේ'** මුතුවන් අකුරින් පිටපත් කරන ලදි. කවි පිටුවේ සංස්කාරක **'රත්න ශ්‍රී විජේසිංහ'** කිවිසුරාණෝ, පරිවර්තනය පමණක් නොව ඉංග්‍රීසි කවියේ කොටසක්ද පළ කළ බව කෘතවේදීව සඳහන් කළ යුතුය.

1999 වසරේ පළ කළ මගේ දෙවැනි කවි පොත වූ **'සන්තාප නිවාඩුවේ'** 40 වැනි කවිය වූයේ **'අරුණෝදය බොහෝ දුරය'** නිර්මාණයයි. පසු කලෙකත් මුල් ඉංග්‍රීසි කවිය පරිවර්තනයේදී ඇතිවූ යම් යම් අඩුපාඩු නිවැරදි කරන ලද්දේ, ප්‍රවීණ ඉංග්‍රිසි ආචාර්යවරයකු වූ **'මහින්ද දිසානායක'** මහතාය. (මෙහි පළවී ඇති ඉංග්‍රීසි කවිය පිටපත් කළේ ඔහුගේ සිසුවියක වූ **"කිම් ලක්ෂිකා රූපසිංහ"** බව ද ස්තූතිපූර්වකව සඳහන් කළ යුතුය.)

මේ ඉංග්‍රීසි කවිය මා හට දුන් ආදරණීය සොහොයුරා අතුරුදන් වූ බව අපට දැනගන්නට ලැබිණි. අප බොහෝ දෙනෙකුට නැති ඉහළ පාන්තික පෙනුමක් ඔහු සතු විය.

කෙසේ හෝ වේවා තිස් පස් වසරක් ගිය තැන, **'අරුණෝදය බොහෝ දුර** නොවූ බව දැන ගන්නට දිවි පිදූ දස දහස් ගණින් සොයුරු සොයුරියන්ට හැකි වූවා නම් එය කොතරම් භාග්‍යයක් ද?

**▶ තිස්ස නිහාල් වික්‍රමසිංහ**

## මගේ නිහඬ රාත්‍රිය

සුදුපාට කුරුල්ලෙක් පියඹා අවුත්
පාළු රෑ සිහිනයක නිසොල්මන් වී වසා
කවම කවදාකවත් ඉතින් නෑසූ හඬින්
හැඬුම්බර ගීයක් කියාගෙන ඇදවැටේ

ඈත අධිකාරී ගමෙන් හැල්මේ ඇවිත්
අඳුර සැරසුන් තැන්න පොළොවේ දිග ඇදේ
ගිරි සිඛර රෑ සීතලෙන් වෙවුලා සැලී
"පාළු දැයි පුත" ආදරෙන් විමසත් මගෙන්

පාළුවට ඉහ අද්දරින් තරුවක් තියා
ඇස් පියා උස කඳුමුදුන් නොසැලී හිඳිත්
ගස් මුදුන් ඇහැර බොහෝ රෑ මැදියමේ
අත්වලින් අතගගා මගේ හිස පිරිමදී

මවුබිමේ නොහඳුනන මිටියාවත් පුරා
ඇස් වසා හදවත් බොහෝ සාමෙන් නිදයි
මැදියමේ මහියංගණේ මිහිකොත් යුරා
හරි මැදින් අහසෙ කඳුළු පායා තියේ

දුරු රටින් සුළඟක් ඇවිත් මිතුරෙක් වගේ
කඳුවලින් බැස වාඩියට කරබාන එයි
ඈත රන්දෙණිගල පොළෝ පතුලේ නිධන්
කඳුළු දිය සීරා බොහෝ රූ ගලත්

මවුළයත් පෑරී රිදී හැඬූ මේ රැයේ
පාමුලින් ලන්තෑරුමක් දල්වා තියා
වන්දනාවට එනතුරා පේවී යළි
සහෝදරවරුනේ මමත් නොනිදා හිඳිමි

**▶ රෝහිත භාෂණ**
භීෂණ සමය අතරේ ලියූ කවියකි

ප්‍රවේශ
මියන් සංවාදයට පෙරවදනක්

# මට දොස්තරකම් ඕනෑ නැහැ අපට ඕනෑ නිවැරැදි පාරේ යන්න

## බෙනට් සිරිසේන සහෝදරයාට විජේවීර කියූ කතාව

ඔහු නමින් බෙනට් සිරිසේනය. ජනතා විමුක්ති පෙරමුණු දේශපාලනය තුළ ඔහු හඳුන්වනු ලැබුවේ බෙනට් මහත්තයා ලෙසය. රෝහණ විජේවීර සහෝදරයා සමග කුඩා කාලයේ සිටම ළඟ ඇසුරක් පැවැත්වූ ඔහු රෝහණ සහෝදරයාගේ පුද්ගලික මිත්‍රයා මෙන්ම දේශපාලන මිත්‍රයාද බෙනට් මහතාය. මේ ඔහු රෝහණ විජේවීර සහෝදරයා පිළිබඳව සිදු කළ මතකාවර්ජනයකි.



බෙනට් සිරිසේන

**ඔබ සහ රෝහණ සහෝදරයා අතර තිබූ සමීප සබඳතාව ගැන සිහිපත් කිරීමක් කළ හැකිද?**

මම උපන්නේ ගන්දර, 1939. රෝහණ විජේවීර උපන්නේ 1943 තංගල්ල ප්‍රදේශයේයි. විජේවීර සහෝදරයා ටික කලක් යද්දී, තාත්තගේ ගම වෙච්ච මාතර කෝට්ටෙගොඩට ආවා. මගේ පියා සහ ඔහුගේ පියයි කලක සිට ළඟම යාළුවෝ. ඒ සම්බන්ධය හැදුණේ, දෙන්නම එස්. ඒ. වික්‍රමසිංහ මහත්තයත් එක්ක කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ වෙලා හිටපු නිසා. මගේ තාත්තා සහ රෝහණගේ තාත්තා කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලනය තුළ ගොඩක් ක්‍රියාකාරිව සිටි අය.

**එදා මැතිවරණයේදී ලැබුණ ප්‍රතිඵලය කුමක්ද ?**

කෝට්ටෙගොඩ අයිති වුණේ හක්මණ ආසනයට. කොමියුනිස්ට් පක්ෂයෙන් හක්මණ ආසනයට 'තරුව' ලකුණින් ඉල්ලුවෙ ප්‍රේමලාල් කුමාරසිරි. කෝට්ටෙගොඩ පෝලිං බූත් එකේ කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතයා වුණේ විජේවීර සහෝදරයගේ තාත්තා, අන්ද්‍රියස් විජේවීර. ඡන්ද විමසීම ඉවර වෙලා ඡන්ද පෙට්ටි ගෙනියන කොට ඒක පිටිපස්සෙන් පක්ෂවල කට්ටිය යන සම්ප්‍රදායක් තිබුණා. මේ ගොල්ලොත් කාර් එකකින් ගියා. තලල්ල හන්දියේ දී එක්සත් ජාතික පක්ෂෙ මැරයෝ කණ්ඩායමක් වාහනය හරස් කරලා නතර කළා. ඒ අය අන්ද්‍රියස් විජේවීර එළියට ඇදල අරන් පහර දුන්නා. සිද්ධියෙන් පස්සේ එයාව මාතර රෝහලට අරගෙන ගියා. සුෂුම්නාව කැඩිලා නිසා සනීප කරන්න බැරි තත්ත්වයක් ඇති වුණා. එතැන් සිට මිය යන තෙක්ම එයා ඔත්පළ වෙලයි හිටියෙ. 1947දී තමයි මාතර ආසන තුනක්ම කොමියුනිස්ට් පක්ෂය ජයගත්තේ.

**ඒ සිදුවීම විජේවීර සහෝදරයාගේ ජීවිතයට සහ ඔහුගේ පවුලට බලපෑමක් කළේ මොන විදිහටද ?**

විජේවීර සහෝදරයාගෙ තාත්තත්, අපේ තාත්තත් තොග වෙළෙඳාම් කරපු අය. මේ සිදුවීම නිසා විජේවීර පවුල ආර්ථික අතින් පහළට වැටුණා. වික්‍රමසිංහ මහත්තයත්, අපේ තාත්තත් උදව් පදව් කළා. ඒ කාලෙ එයාල පදිංචි වෙලා හිටියෙ හුන්නදෙණිය කියන ගමේ. විජේවීර කොමියුනිස්ට් පක්ෂයේ තරුණ අංශයේ වැඩ කළා. 1960 සෝවියට් ශිෂ්‍යත්ව ආවා. එස්. ඒ. වික්‍රමසිංහ මහත්තයා තීරණය කළා රෝහණ විජේවීර සහෝදරයටත් ශිෂ්‍යත්වයක් දෙන්න.

**සෝවියට් දේශයට ගිය විජේවීර සහෝදරයා සහ ඔබ අතර තිබූ සම්බන්ධතාව කොහොමද?**

දැන් කාලෙ වගේ කතා කරන්න විදිහක් නෑනෙ. ඒත්, ප්‍රේමලාල් කුමාරසිරිගෙ නෝනා අතේ මම ලියුමක් ඇරියා. ඒකට උත්තරයක් එවල තිබුණා. බෙනට් අයියෙ, සනීපෙන් ඉන්නවා කියලා. නමුත්, ඒකෙ තිබුණා, සෝවියට් දේශයේ සමාජවාදයේ ප්‍රශ්න තියෙන බව. වික්‍රමසිංහ මහත්තයට අපි ගරු කරන්න ඕනෑ. ඒ වුණාට එයා හැම තිස්සෙම අදහස් උදහස් ගන්නෙ එංගලන්ත කොමියුනිස්ට් පක්ෂයෙන්. ඒකෙ ලේකම් හැරී පොලිට්. එයා කියන ඒවා තමයි, වික්‍රමසිංහ මහත්තයා කියන්නෙ. රුසියාව හරි කිව්වොත් හැරී පොලිට් හරි කියනවා. හැරී පොලිට් හරි කිවුවාම වික්‍රමසිංහ මහත්තයත් ඒක හරි කියනවා. එයා වැරැදියි කිවුවොත්, වික්‍රමසිංහ මහත්තයත් ඒක වැරැදියි කියනවා. ඉතිං, අපිට ඒක කරන්න බෑනෙ. ලියූ ෂාඕ චී කියන දේවල් හරියටම හරි කියලා. ඔය අතරේ 1964දී විතර මෙයා නිවාඩුවකට ලංකාවට ආවා.

මේක කර ගත්තොත්, මෙයා දොස්තර කෙනෙක් නෙ. පුළුවන් නම්, බී. වයි. තුඩාවෙවත් හමුවෙලා මේ ගැන කියන්න කියලා. ඊට පස්සෙ මමයි, අපේ තාත්තයි බී. වයි. තුඩාවෙත් එක්ක ගියා දොස්තර වික්‍රමසිංහ හමුවෙන්න. අපේ තාත්තා වික්‍රමසිංහ මහත්තයට මේ ප්‍රශ්නය ගැන කිවුවා. "මායි, අන්ද්‍රියස් මුදලාලියි එකටම පක්ෂෙ වැඩ කළේ, එයා දැන් අන්තිම අසරණ වෙලා ඉන්නෙ, එයාගෙ පුතාගෙ වීසා තහනම් කරලා තියෙනවා, මේක හදල දෙන්න. මේක හරිම අසාධාරණ වැඩක්" කියල වික්‍රමසිංහ මහත්තය කිවුවා, "මුදලාලි මගෙ නම් කිසිම ප්‍රශ්නයක් නෑ, කෙනමන් තමයි මේකෙ මුලින්ම ඉන්නෙ. මම කෙනමන් එක්ක කතා කරලා කියන්නම්, දවස් තුන හතරකින් එන්න" කියලා. ඊට පස්සෙ මම දවස් හතරකින් විතර ගියා. දොස්තර වික්‍රමසිංහ කිව්වා, එයාට කියන්න, ඔයාගෙ යාළුවා නේ, ඔය හිතේ තියෙන අදහස් අරවා මේවා අයින් කරන්න කියලා. ඒත් ඔහු ඒ අදහස පිළිගත්තේ නැහැ. ඔහු මට කිවුවෙ අනේ ! බෙනට් අයියේ මට දොස්තරකම් ඕනෑ නැහැ අපට ඕනෑ නිවැරැදි පාරේ යන්න කියලා.

**මේ සිදුවීම් මාලාවෙන් පසු රෝහණ විජේවීර සහෝදරයාටත් ඔහුගේ දේශපාලනයටත් මොකද වුණේ?**

මේ කාලෙ කොමියුනිස්ට් පක්ෂයෙන් චීන පිල ලෙස කොටසක් කැඩුණා. ෂන්මුගදාසන්, ප්‍රේමලාල් කුමාරසිරි චීන පිල හැදුවා. ඊට පස්සෙ විජේවීර සහෝදරයා චීන පිලට බැඳිලා වැඩ කරන්න පටන් ගත්තා. ඒත්, මම කොමියුනිස්ට් පක්ෂයෙන් අයින් වුණේ නෑ. මෙයා වැඩිපුර කැමැති ප්‍රේමලාල්ට. එයා චීන පිලේ ෆුල් ටයිමර් කෙනෙක් වුණා. ඒ කාලේ මෙයාගෙ ගෙදර ආර්ථිකේ හොඳටම අමාරු වෙලා තිබුණේ. ඒ එක්කම එයාගෙ තාත්තා මැරුණා. ඒ මරණෙ වෙනුවෙන් හුන්නදෙණිය පුරාම රතු කොඩි දාලා තිබුණා. මළගෙදර වැඩ කළේ ඇත්තටම චීන පිලේ අය. අන්ද්‍රියෙස් විජේවීරට දක්වපු ගෞරවය ගැන ප්‍රදේශයේ විශාල හැඟීමක් ඇති වුණා. මළගෙදරින් පස්සෙ විජේවීර සහෝදරයා දිගටම පක්ෂෙ වැඩ කරන්න ගත්තා.

**1971 අප්‍රේල් කැරැල්ල පිළිබඳව මොකද හිතන්නේ?**

මේ වෙනකොට පක්ෂ නායකයා හිටියේ ආණ්ඩුවේ අත්අඩංගුවේ. පක්ෂ නායකයා මේ ප්‍රහාරයට අනුමැතිය දීලා තිබුණේත් නැහැ. ඒ වෙලාවේ පහර දිය යුතුයි කියන ස්ථාවරයේ බහුතරයක් නායකයන් හිටියෙත් නැහැ. මේ තීරණය පක්ෂයේ අභ්‍යන්තරයේ තිබුණ අරගලයක ප්‍රතිඵලයක්.

**▶ උදිත ගුණවර්ධන**



## මරා දැමීමට පෙරාතුව

නුඹ මරණ රූපය
එල්ලා ඇත නගරයේ හැමතැන
මුඩුක්කු පැල්පත් එක දිගට
දොරින් දොර මුමුනත
මරණ බය ගැන
ඇස්වල රහස් සැඟවෙන
ලේ සිඳුණු සුදුමැලි මුහුණුවල
මිනිස්සු දැන් දැන් දනිත
නුඹ මරණ වග...
එද රහසක් උපදින වග
(මරණයටත් පෙරම)
සිය ගණන් වූ මිනිස් සිත් සතන්
තුළ...
වැඩබිම්වල,
පාසල්වල,
සරසවිවල
අනාථාගාරවල...
එහෙත් උන් ඒ වග සඟවන
ලේ ගලා යන ධමනි ශිරා තුළ
ගිනිගත් මං මාවත් මැද
වේගයෙන් ගෙවී යන පා නැඟුම්
තුළ
මරණීය නිහඬ වග කැටි ගැසෙයි...
දහඩියෙන් දියව කැළතෙන
දහසක් මුහුණු අතරේ කොතැන
හෝ
නුඹ සොයමින්
මරණීය ඔත්තුකරුවකු සරන වග
බියෙන් කිලිපොළන
සුවහසක් දෑස් හඟවයි
ඒත් උන් ඒ වග හෙළි නොකරයි....
කෙදිනක දී හෝ
මේ බය බිරාන්තය පුපුරයි...
කුසගින්න පීඩනය විඳගැනුම
මරණයෙනුත් එහා වග
උන් එවිට උගනියි...

**▶ නිමල් ශාන්ත රත්නායක**

කවර නිර්මාණය
**ගන්දික ධර්මබන්දු**
පිටු සැකසුම
**දීපාල් සංජීව සරත්මදු**

වර්ෂ 2024ක් වූ නොවැම්බර් මස 13 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.